4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට,සියලුම විගණන විමසුම් වලට පිලිතුරු ලබා දී තිබීම	අනුකූල නොවේ	2022 වර්ෂය සඳහා නව විගණන විමසුම් 62 ක් ලැබී ඇති අතර එම විමසුම් වලින් 55 සඳහා මසක් ඇතුළත නිරීක්ෂණ ලබා දී ඇත. ඉන් 2022 දෙසැම්බර් මස තුළ විගණන විමසුම් 15ක් ලැබී ඇත.2022.12.19 ලද විගණන විමසුම, 2022.12.27 ලද විගණන විමසුම් 13 සහ 2022.12.30 ලද විගණන විමසුම සඳහා මසක් ඇතුළත නිරීක්ෂණ ලබාදී ඇත. විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව 2022 වර්ෂයේ වැඩකරන ලද දින 07ක් ඇතුළත ලබා දී ඇත. කළමණාකරණ විගණන වාර්තාව සඳහා නියමිත දිනට නිරීක්ෂණ ලබා දී ඇත. රටේ පැවති අර්බුදකාරී කාලපරිච්ඡේදය තුළ නිලධාරීන්ගේ පැමිණීම සීමාකිරීම සඳහා විවිධ චක්‍රලේඛ ක්‍රියාත්මක විම නිසා විගනන විමසුම් 07ක් සඳහා නිරීක්ෂණ ලබා දීමට මසකට වඩා වැඩි කාලයක් ගතවී ඇත.	ලැබෙන විගණන විමසුම් බොහෝමයක් සඳහා දින 03ක් හෝ දින 07ක් ඇතුළත නිරීක්ෂණ ලබාදිය යුතු අතර අදාල ආයතන වලින් පිළිතුරු ගෙන්වාගෙන නිරීක්ෂණ යැවීම සඳහා විගණකාධිපති නියමකොට ඇති කාලය ප්‍රමාණවත් නොවේ.

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ/ ක්‍රියාමාර්ග
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව,වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	2022 වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා විගණන වාර්තා 92 ක් යොමුකර ඇති අතර එයින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14ක විගණන වාර්තා 37 ක් සඳහා පිළිතුරු සැපයීම ප්‍රමාද වීම සිදුවී තිබේ.රටේ පැවති අර්බුධකාරී කාලපරිච්ඡේදය තුළ නිලධාරීන්ගේ පැමිණිම සීමාකිරීම සඳහා විවිධ චක්‍රලේඛ ක්‍රියාත්මක වීම මෙම තත්ත්වයට හේතු වී තිබේ.	පිළිතුරු සැපයීමට නියමිත දිනයට පෙර දුරකථන මාර්ගයෙන් විමසීම, සිහිකැඳවීම් ලිපි යොමු කිරීම හා ප්‍රාදේශීය විගණන කළමනාකරණ කමිටු වලදි නිරන්තරයෙන් විමසීම් කිරීම.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව,සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ/ ක්‍රියාමාර්ග
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛ 13වන පරිච්ඡේදය ප්‍රකාරව,එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව,භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	-		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ/ ක්‍රියාමාර්ග
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව,වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වාහන 08න් වාහන 05ක ඉන්ධන දහනය පරීක්ෂා කර ඇත.	රට තුළ ඉන්ධන ගැටළු නොපවතී නම් මෙවැනි ගැටළු ඇති නොවන පරිදි කටයුතු කල හැකිය.
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදි හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ	කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අංක 035-1-00-1-16294980 දරණ නිල බැංකු ගිණුමට අදාලව සිදු වූ චෙක්පත් වංචාවක් හේතුවෙන් අධි ගෙවීමක් සිදුවීම නිසා බැංකු ගිණුමේ හා මුදල් පොතේ ශේෂය නොසැසඳීම මත මෙම ගිණුම වැසීමට නොහැකි වී ඇත.	මූල්‍ය ගණුදෙනු සම්බන්ධව අභ්‍යන්තර පාලනය විධිමත් කිරීම හා අධීක්ෂණය කිරීම.
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ/ ක්‍රියාමාර්ග
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	මියගිය එක් නිලධාරියකුගෙන් රු.53,300.00 (එල්.එල්.ඩී.කැළුම්), විශ්‍රාම ගිය නිලධාරීන් තිදෙනකුගෙන් රු.313,346.73 ද (ඩබ්.එම්.එස්.විජේ කෝන්,එච්.සුනිල්, එස් .එච්.ආර්.ඒ. පුෂ්පකුමාර) හා වැඩ තහනම් කල එක් නිලධාරියකුගෙන් රු.90,697.73 ද (ඩබ්.එච්.සී. එල්.වේවැල්වල)අයවිය යුතුව තිබේ.	2017.12.31 දින දී සේවය හැර ගොස් ඇති සංවර්ධන නිලධාරී ඩබ්.එච්.සී.එල්. වේවැල්වල මයා ගේ ණය ශේෂය වූ රු. 140,679.92 මුදල ඔහුගේ බිරිඳ විසින් මසකට රු 2,500.00 වාරික වශයෙන් ගෙවමින් පවතින අතර 2022.12.31 දින වන විට රු 49.982.19 ක මුදලක් නිරවුල් වී ඇත. ඔහුගේ වර්තමාන ණය ශේෂය රු.90,697.73 කි. අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සේවය කළ 2020.07.16 දින මිය ගොස් ඇති ග්‍රාම නිලධාරී එල්.එල්.ඩී.කැළුම් මයා ගේ රු. 53,300.00ක් වූ ණය ශේෂය මේ වන විට නිරවුල් වී ඇත.

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ/ ක්‍රියාමාර්ග
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂ අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම්**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	-		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ/ ක්‍රියාමාර්ග
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්යමණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල නොවේ	නිලධාරීන් පත් කිරීම දිස්ත්‍රික් ලේකම් විසින් සිදුනොකරන අතර, අනුමත කාර්ය මණ්ඩල සීමාව ඉක්මවා අමාත්‍යාංශය විසින් නිලධාරීන් අනුයුක්ත කිරීම හා පත්වීම් ලබාදීම නිසා නිලධාරීන්ගේ අතිරික්තයක් පවතී. අමාත්‍යාංශය විසින් පුරප්පාඩු සඳහා නිලධාරීන් පත් නොකිරීම.	අනුමත කාර්ය මණ්ඩලයට සරිලන පරිදි නිලධාරීන් අනුයුක්ත කිරීම හා පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කිරීමට කටයුතු කිරීම.
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර , වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ/ ක්‍රියාමාර්ග
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05 / 2008 හා 05 / 2008 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තියක්සම්පාදනය කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැ ස්ම තුළ තහවුරු කර තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

****

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. SPCG/GL/A/GDS/2/2022/08

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 මැයි 10 දින.

දිස්ත්‍රික් ලේකම්,
ගාල්ල.

ශීර්ෂය 261 - ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 261 - ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගාල්ල දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 10 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1 (ආ) (ii)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු සියළුම වත්කම් තක්සේරු කර වටිනාකම ගිණුම්ගත කළ යුතුය.	1.6.1(ඇ)
1.6.1(ආ)(iv)	ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත පවරා ඇති සියළුම ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.	1.6.1(ඇ)

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකෙරේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ වෙනත් ශීර්ෂයන් වෙතින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලැබුණු වටිනාකම රු.411,264 ක් වූ මෝටර් රථ හා යන්ත්‍ර උපකරණ නිත්‍යානුකූලව පවරා නොගෙන ආයතනයේ වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන සිගාස් BOS වාර්තාවල සාරාංශ වාර්තාව අනුව වත්කම් වටිනාකම් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් ලබා ගත් වත්කම් වටිනාකම් පිළිබඳ තොරතුරු අනුව ගොඩනැගිලි (1951), මෝටර් රථ හා යන්ත්‍රෝපකරණ (1952), ඉඩම් (1953) යන වත්කම් කාණ්ඩයන්හි එකතුව රු. 175,496,959 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) ස්ථාවර වත්කම් ලේඛනය අනුව කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් පියදිගම ශිෂ්‍ය බළ ඇණිය ගොඩනැගිල්ල හා මාදම්පාගම නව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගොඩනැගිල්ල තක්සේරු කර වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත පවරා දී තිබූ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් වසා දමන ලද පාසල් 78 ක ඉඩම් අක්කර 107 ක් හා ගොඩනැගිලි 125 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

1.6.2 අග්‍රිම ශේෂය

කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2006 වර්ෂයේ සිදුවී තිබුණු වෙක්පත් වංචාවක් හේතුවෙන් ඉදිරියට ගෙන එන ලද නොපියවූ ශේෂය 2022 දෙසැම්බර් 31 දිනට රු.115,536 ක් විය.

1.6.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකෙරේ.

(අ) 2021 ජූලි 04 වන දින නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහනයට සිදුවූ අනතුර සම්බන්ධයෙන් වූ අලුත්වැඩියාව සඳහා ගරාජයක් විසින් 2021 නොවැම්බර් 25 දින මුළු වටිනාකම රු.92,794 ක් වූ ඉන්වොයිසිය ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව මෙම වියදම රක්ෂණ සමාගමෙන් ලද රු.74,412 ක මුදලින් පියවා තිබූ අතර රක්ෂණාවරණයෙන් ආවරණය නොවන රු.18,382 ක ශේෂය පියවීමට අදාළ සාක්ෂි ඉදිරිපත් නොවුණි.

(ආ) කඩවත්සතර, හික්කඩුව, බෝපෙ පෝද්දල, බලපිටිය හා බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් තබා ඇති ඇප පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකෙරේ.

(අ) පුනරාවර්තන වැය විෂයයන් 04 ක ඉතිරි වීම් සියයට 17 ත් සියයට 82 ත් අතර පරාසයක පැවතුණි.

(ආ) මූලධන වැය විෂය අංක 2509 යටතේ වන ව්‍යාපෘති 03 ක ඉතිරි වීම් සියයට 19 ත් සියයට 29 ත් අතර පරාසයක පැවතුණි.

(ඇ) වැය විෂයයන් 06 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා වෙනත් වැය විෂයයන් 06 කින් සියයට 4 සිට සියයට 30 දක්වා පරාසයක ප්‍රතිපාදන මාරු කර වියදම් දරා තිබුණි.

(ඈ) වැය විෂයයන් 05 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම නිසා එම ප්‍රතිපාදනයෙන් සියයට 1 සිට සියයට 21 දක්වා පරාසයකින් ප්‍රතිපාදන වෙනත් වැය විෂයන්ට මාරු කිරීමට කටයුතු කර තිබුණි.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව දරන ලද බැරකම් මත වැය ප්‍රමාණය කිසිම විටෙක මුදල් වර්ෂය සඳහා ප්‍රතිපාදන මුදල නොඉක්මවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 1508 වැය විෂය සඳහා ප්‍රතිපාදන ඉක්මවා රු.6,685 ක බැරකම්වලට බැඳී තිබුණි.

2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

අමාත්‍යාංශ 26 කින්, දෙපාර්තමේන්තු 16 කින් හා වෙනත් ආයතනයකින් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට පිළිවෙලින් රු.2,734,680,577 ක්, රු.612,569,086 ක් හා රු.539,199 ක් ලෙස එකතුව රු.3,347,788,862 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. එම ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට පිළිවෙලින් රු.2,660,536,447 ක්, රු.523,370,668 ක් හා රු.496,205 ක් ලෙස එකතුව රු.3,184,403,320 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව පිළිවෙලින් රු.74,144,130 ක්ද, රු.89,198,418 ක්ද , රු. 42,994 ක්ද ලෙස ප්‍රතිපාදනයෙන් එකතුව රු.163,385,542 ක් ඉතිරිවී තිබූ අතර එය පිළිවෙලින් සියයට 3 ක්, සියයට 15 ක් හා සියයට 8 ක් විය.

2.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත විස්තර දැක්වෙන අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව	මුදල	අනුකූල නොවීම
	රු.	
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ		
(අ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි 3.1 ඡේදය		සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කරුණු අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වාහන 03ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.
(ආ) 2019 සැප්තැම්බර් 30 දිනැති අංක 30/2019 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 (iii) ඡේදය		යම් නිලධරයෙකු විසින් සිදු කරන ලද විෂමාචාරයක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද චෝදනා පත්‍රයකට අදාළව පවත්වනු ලබන විධිමත් විනය පරීක්ෂණය ආරම්භ කර මාස 06 ක් ඇතුළත නිම කළ යුතුය. අමතර කාලයක් අවශ්‍ය වන්නේ නම් පරීක්ෂණ නිලධාරීන් විසින් ප්‍රමාණවත් පිළිගතහැකි හේතු ඉදිරිපත් කරමින් විනය බලධාරියාගේ අනුමැතිය ලබා ගත යුතු වුවත් විනය පරීක්ෂණ 04 ක් නිම කිරීම සඳහා මාස 06 කට වැඩි කාලයක් ගතවී තිබුණි.

2.6 අවධිමත් ගනුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද ගම සමග පිළිසඳර වැඩසටහන යටතේ ජීවනෝපාය සංවර්ධනය වෙනුවෙන් මසක් වයසැති ගැමි කිකිලි පැටවුන් 1,822 ක් සැපයීම වෙනුවෙන් රු.865,450 ක් ගෙවීම සඳහා 2022 අගෝස්තු 30 දිනැති චෙක්පත පිළියෙල කර තිබුණි. 2023 මාර්තු 23 වන විගණන පරීක්ෂණ දිනය වන විටත් කිකිළි පැටවුන් සපයා නොතිබුණු බැවින් මාස 07 කට ආසන්න කාලයක් චෙක්පත අත රඳවාගෙන තිබුණි. මුදල් රෙගුලාසි 137(5) ප්‍රකාරව සැපයීම් සම්බන්ධයෙන් වන අවස්ථාවලදී ඒවා පරීක්ෂාකොට නිවැරදි ලෙස භාරගෙන තිබෙන බව සහතික වීමකින් තොරව සැපයුම් සඳහා ගෙවීම් කිරීම අනුමත නොකළ යුතු වුවද ඊට පටහැනිව කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්තව සේවය කරනු ලැබූ සමෘද්ධි සංවර්ධන නිලධාරියෙකු 2019 දෙසැම්බර් 10 දින සිට දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස සේවය කර තිබුණි. ආයතන සංග්‍රහයේ XXX වැනි පරිච්ඡේදයේ 1.3 වගන්තිය අනුව ලේකම්වරයාගේ අවසරය කල් ඇතිව ලබා ගැනීමකින් තොරව මෙලෙස සේවය කිරීම වෙනුවෙන් 2019 දෙසැම්බර් මස සිට 2021 අප්‍රේල් මාසය දක්වා සමෘද්ධි සංවර්ධන නිලධාරියෙකු ලෙස එකතුව රු.612,692 ක්ද, මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා වශයෙන් එම කාල පරිච්ඡේදයට අදාළවම රු.1,165,625 ක්ද වැටුප් හා දීමනා වශයෙන් අවධිමත්ව ලබාගෙන තිබුණි.

2.7 තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

2020 අගොස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 9 ඡේදය මගින් සංශෝධිත මු.රෙ.371(2) (ආ) ප්‍රකාරව කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමය දක්වා තත්කාර්යය අතුරු අග්‍රිමයක් ලබා දීමට හැකිවේ. එම සීමාව ඉක්මවන අවස්ථාවේදී කටයුතු කළ යුතු ආකාරය මුදල් රෙගුලාසිවල පැහැදිලිව දක්වා තිබියදී ඊට පටහැනිව 2022 නොවැම්බර් 05 දින කිතුල් කර්මාන්ත ව්‍යවසායකත්ව වැඩසටහන සඳහා

සහභාගීත්ව දීමනා ගෙවීම වෙනුවෙන් මාණ්ඩලික නිලධාරීන් තිදෙනෙකු වෙත රු.75,000 බැගින් රු.225,000 ක් අත්තිකාරම් ලබා දී තිබුණි.

2.8 තැන්පතු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඊට අනුබද්ධ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 ට අදාළව රු.239,462,961 ක් වූ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) තැන්පතු ගිණුමේ ශේෂය තුළ ඇතුළත් 2019 දෙසැම්බර් 31 දින වම්ලා සෝමරත්න පදනම විසින් මාදම්පාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදි කිරීම සඳහා ලබා දුන් රු.10,000,000 ක මුදල් 2023 මාර්තු 31 දින වන විටත් අදාළ ඉදි කිරීමේ කටයුතු සඳහා යොදා නොගෙන තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

2.9 බැංකු ගිණුම් මෙහෙයවීම

2022 දෙසැම්බර් 31 දිනට නිකුත් කර ඇති නමුත් බැංකුවට ඉදිරිපත්වී නොමැති නෙළුව, තවලම හා ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් චෙක්පත් 7 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි 391 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලැසුම් කිරීම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2022 වර්ෂය තුළදී ක්‍රියාකාරී සැලැස්ම සහ එහි ප්‍රගතිය පිළිබඳ පරීක්ෂා කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 ක් මගින් ක්‍රියාත්මක කරන ලද ගම සමග පිළිසඳර වැඩසටහන යටතේ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය, පළාත් පාලන කොට්ඨාශ සංවර්ධනය සහ ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා භෞතික ඉලක්කයන් පිළිවෙලින් 9,616 ක්, 3,666 ක් සහ 3,081 ක් වුවද, එම ව්‍යාපෘතිවල

භෞතික ප්‍රගතිය පිළිවෙලින් 2,160 ක්, 771 ක් සහ 448 ක් විය. ඒ අනුව ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති 7,456 ක් ද පළාත් පාලන කොට්ඨාශ සංවර්ධන ව්‍යාපෘති 2,895 ක් ද ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති 2,633 ක් ද ඉටු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) ඉමදුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2022 වසර තුළදී අනවසර ඉඩම් සඳහා විධිමත් බලපත්‍ර 100 ක් නිකුත් කිරීමට හා දීමනා පත්‍ර 35 ක් සැකසීමට ඉලක්ක කර තිබුණද වර්ෂය තුළදී බලපත්‍ර 56 ක් නිකුත් කිරීමට හා දීමනා පත්‍ර 22 ක් පමණක් සකස් කර තිබුණි.

3.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගතිය අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ක්‍රියාත්මක කරන ලද ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති 2,168 ක වැඩ නිමකර ඇති බව දන්වා තිබුණද, ව්‍යාපෘති 08 ක් වෙනුවෙන් කිසිදු මුදලක් වියදම් කර නොතිබුණු බැවින් එම ව්‍යාපෘතිවල වැඩ අවසන් කර නොතිබුණි.

3.1.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

රු.2,000,000 ක ඇස්තමේන්තුගත මුදලකට ඉමදුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් හවුපෙ උතුර නිල සෙවන ගොඩනැගිල්ල 2018 වර්ෂයේදී ඉදි කිරීම ආරම්භ කර තිබුණද 2022 දෙසැම්බර් 31 දින වන විටත් රු.37,800 ක් වැය කර එහි අත්තිවාරම පමණක් ඉදිකර තිබුණි.

3.2 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

2019 වර්ෂයේදී ආරම්භ කරන ලද ඇස්තමේන්තුගත පිරිවැය රු.3,154,877,678 ක් වූ ආසන 2000 ශ්‍රවණාගාරය ඉදි කිරීමට අදාළව 2023 මාර්තු 16 දින වන විට ව්‍යාපෘති උපදේශක විසින් නිර්දේශිත මුළු බිල් පත් වටිනාකම රු.966,723,463 ක් වී තිබුණි. මෙය ඇස්තමේන්තුගත වටිනාකමින් සියයට 30 ක් වී තිබුණද, විගණන දිනය වූ 2022 මාර්තු 24 දින වන විට එහි භෞතික ප්‍රගතිය සියයට 15 ක තරම් අඩු මට්ටමක පැවති අතර එදිනට රු.195,170,420 ක් ගෙවීම් කර තිබුණි. ඒ වන විට කොන්ත්‍රාත්කරුට ලබා දී තිබූ රු.426,330,247 ක අත්තිකාරම් මුදල් ආපසු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට මෙම ව්‍යාපෘතියේ කටයුතු නවතා දමා ඇති අතර අත්තිකාරම් බැඳුම්කර මෙන්ම රක්ෂණාවරණයන්ද කල් පිරී පැවතීමක්

නිරීක්ෂණය වූ බැවින් මෙම අය කර නොගත් අත්තිකාරම් මුදල් තවදුරටත් අය කර ගැනීමේ අවදානමක් නිරීක්ෂණය විය.

3.3 ප්‍රසම්පාදනයන්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 ප්‍රකාරව රු.500,000 ඉක්මවන භාණ්ඩ හා සේවා මිලදී ගැනීම්වලදී විධිමත් ගිවිසුමකට එළඹිය යුතු වුවද ඉමදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එකතුව රු.19,227,845 ක් වූ භාණ්ඩ හා සේවා මිලදී ගැනීම් අවස්ථා 11 ක දී ඊට අනුකූලව ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 හි 4.3 ප්‍රකාරව සියළු ආශ්‍රිත වියදම් ඇතුළුව මුළු පිරිවැය ඇස්තමේන්තු ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කොට අදාළ අධිකාරිය විසින් අනුමත කළ යුතු වුවද නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2021 වර්ෂයේදී මිලදී ගත් රු.877,100 ක් වටිනා භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන් හා 2022 වර්ෂයේ ජූනි දක්වා මිලදීගත් රු.427,300 ක් වටිනා භාණ්ඩ සම්බන්ධව එලෙස කටයුතු කර නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 128(ඉ) ප්‍රකාරව රජය සතු වූ හෝ රජය භාරයේ පවත්නා මුදල්, බඩු බාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යෙදනු ලබන බවට හා ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත් ඒවා නිසියාකාරව නිෂ්කාශනය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශනය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බවටත් ගණන්දීමේ නිලධාරියෙකු සිය ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට වගකිවයුතුය. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් දළ වටිනාකම රු.1,000,000 ක් වූ කැබරථයක් 2020 මාර්තු 10 සිට 2022 ජූලි 20 දින දක්වා කාර්යාලයේ ගරාජය තුළද, විගණිත දිනය වූ 2023 මාර්තු 27 දක්වා බටගංවිල සංචාරක බංගලාව පරිශ්‍රයේද ගාල් කර දිරාපත්ව තිබුණි.

3.5 රජයේ නිලධාරීන් ඇප තැබීම

මුදල් රෙගුලාසි 880 හි විධිවිධාන ප්‍රකාරව රජයේ නිලධාරීන්ගෙන් ඇප අය කිරීම සම්බන්ධයෙන් ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක 04/2022 හා 2022 මාර්තු 16 දිනැති චක්‍රලේඛයෙහි 3 ඡේදයට අදාළ ඇමුණුම මගින් දක්වා ඇති පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් 05 දෙනෙකු විසින් තැබිය යුතු ඇප ප්‍රමාණයට වඩා අඩුවෙන් ඇප තබා තිබූ අතර චක්‍රලේඛයෙහි 05 ඡේදය ප්‍රකාරව ස්ථාන මාරු වී ගොස් සිටි නිලධාරීන් 09 දෙනෙකුගේ ඇප තැබීමට අදාළ ඉතිරි කිරීමේ පාස් පොත් 2023 මාර්තු 28 විගණන පරීක්ෂණ දිනය වන විටත් අදාළ ආයතන ප්‍රධානියා වෙත යොමු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ස්ථාන මාරු වී පැමිණ තිබූ නිලධාරීන් 04 දෙනෙකුගේ පාස් පොත් විගණිත දිනය දක්වා ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.6 අනාර්ථික ගනුදෙනු

බද්දේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය ඉදි කිරීමට රජයට ඉඩමක් අත්පත් කර ගැනීම සඳහා වූ 38(අ) අතුරු විධාන ආඥාව 2001 ජූලි 20 දින නිකුත් කර තිබුණද, වන්දි මුදල් ගෙවා තිබුණේ 2020 නොවැම්බර් 18 දින දීය. මේ හේතුව නිසා සමාලෝචිත වර්ෂය දෙසැම්බර් 31 දිනට රු.10,790,740 ක පොලී මුදලක් ගෙවිය යුතුව තිබුණි.

3.7 කළමනාකරණ දුර්වලතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) බලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන රාජ්‍ය ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය මගින් ඉටු කර ගත හැකිව තිබූ කාර්යයන් 12 ක් අතරින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉටු කර තිබුණේ කාර්යයන් 02 ක් පමණි. 2017 වර්ෂයේදී ආරම්භ කරන ලද මෙම පද්ධතිය මගින් සියළු කටයුතු කාර්යක්ෂමව ඉටු කර ගැනීම සඳහා නිලධාරීන් පුහුණු කර නොතිබුණි.

(ආ) බලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් ලිපිගොනු 20 ක පවතින අඩුපාඩු හේතුවෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2019 පරිදි නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීමට නොහැකිව පැවතුණි.

(ඇ) බලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුබද්ධිත සමෘද්ධි බැංකු සංගම් 4 ක් මගින් සමෘද්ධිලාභීන් වෙත ලබා දුන් ණය මුදලින් 2023 පෙබරවාරි 28 වන විට ණයලාභීන් 197 ක ගේ රු.11,287,644 ක මුදලක් කල් පසු වූ ණය ලෙසද, ණයලාභීන් 174 ක ගේ රු.7,602,302 ක් බොල්ණය ලෙසද, ප්‍රතිලාභීන් විසින් පවත්වාගෙන යනු ලබන තැන්පතු අතුරින් පුද්ගලයන් 3,026 ක ගේ රු.552,845 ක් වූ තැන්පත් අක්‍රීය තැන්පතු ලෙසද හඳුනාගෙන තිබුණි.

(ඈ) කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවසක රත්ගම ප්‍රාදේශීය ලේකම් 2021 මැයි මස සිට 2023 පෙබරවාරි 14 විගණන දිනය දක්වා නිවාස කුලී ගෙවීමකින් තොරව පදිංචිව සිටින බව නිරීක්ෂණය විය. 2023 පෙබරවාරි මස වන විට අය විය යුතු නිවාස කුලිය රු.138,855 ක් වී තිබුණි.

(ඉ) අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් ලිපිගොනුවල පවතින අඩුපාඩු හේතුවෙන් විශ්‍රාම වැටුප් සංශෝධන සිදු කිරීමට නොහැකි වී තිබූ අවස්ථා නිරීක්ෂණය වූ අතර විශ්‍රාම වැටුප් ලිපිගොනුවල ප්‍රමාණවත් තොරතුරු නොමැති වීම හේතුවෙන් විශ්‍රාමිකයන් 17 දෙනෙකුගේ විශ්‍රාම වැටුප් 2019 මැයි 31 දිනැති අංක 14/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි සංශෝධනය කිරීමට නොහැකි වී තිබුණි.

(ඊ) 2019 සැප්තැම්බර් 30 දිනැති අංක 30/2019 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02(i) ඡේදයෙන් සංශෝධිත ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLXIII වැනි පරිච්ඡේදයේ 13.2 උප වගන්තිය ප්‍රකාරව කිසියම් විෂමාචාරයක් සම්බන්ධ මූලික විමර්ශනයක් පැවැත්වීම මාස 02 ක් ඇතුළත අවසන් කළ යුතු බව මූලික විමර්ශනය සඳහා නියෝග කරන අවස්ථාවේදීම විමර්ශන බලධරයා හෝ විමර්ශන කමිටුව වෙත නියම කළ යුතු වුවද, විමර්ශන 06 ක් සම්බන්ධයෙන් මූලික විමර්ශන වාර්තා ලබා දීමේ ප්‍රමාදයක් පැවති අතර අවස්ථා දෙකකදී මූලික විමර්ශන වාර්තා නිකුත් කර නොතිබුණි.

(උ) අග්‍රාමාත්‍ය කාර්යාලය හා ජනාධිපති කාර්යාලය වෙත මහජනයා ඉදිරිපත් කරනු ලබන පැමිණිලි අතරින් ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා පරීක්ෂා කළ යුතු 2022 වර්ෂයට අදාළ පැමිණිලි 97 කින් පැමිණිලි 16 ක් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉඩම් අංශයෙන් හා එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් වාර්තා කැඳවීම් කර ඇති නමුත් පැමිණිලිකරු වෙත අවසන් පිළිතුරක් යවා නොතිබුණි.

4 යහපාලනය

4.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය අනුව ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකයක් නිකුත් කිරීමට ගත වන කාලය දින 14 ක් ලෙස දක්වා තිබුණද ඒ සඳහා මාස 01 සිට මාස 10 දක්වා කාල ප්‍රමාදයන් පැවති බව නිරීක්ෂණය විය.

(ආ) 2004 දෙසැම්බර් 26 දින සිදුවූ සුනාමි ව්‍යසනයෙන් අවතැන්වුවන්ට ඔප්පු ලබා දීමේදී අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ නිවාස ලාභීන් 319 කින් 2022 දෙසැම්බර් 31 දින වන විටත් ඔප්පු ලබා දී තිබුණේ 105 කට පමණි.

5. මානව සම්පත් කළමනාකරණය

අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

සමාලෝචිත වර්ෂය අවසන් වනවිට ආයතනයේ කාර්ය මණ්ඩලයෙහි අතිරික්ත නිලධාරීන් 604 දෙනෙකු විධිමත් පරිදි අනුමත කර ගැනීමකින් තොරව සේවයෙහි නියුක්ත කර තිබුණි.

බී.ජී. අසේල ඉඳුනිල්,
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

බී.ජී. අසේල ඉඳුනිල්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

පිටපත: 1. අධ්‍යක්ෂ ජනරාල් , රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව - කාරුණික දැනගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා.

2. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කාරුණික දැනගැනීම සඳහා.